# ශ්‍රී ලංකාවේ උසස් පෙළ සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයට කියවීමේ පුරුදු මඟින් ඇතිවන බලපෑම

කේ.ජී.එම්.එච්. ප්‍රේමසිරි[1]

***අභිමතාර්ථය 04:*** ඇතුළත් සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

## 1. හැඳින්වීම

කියවීම යනු මානව වර්ගයාගේ දැනුම, කුසලතා වර්ධනයට මෙන්ම තවත් බොහෝ ධනාත්මක ප්‍රතිඵල ලබා දෙන ජීවිතයට ඉතා වැදගත් අංගයකි. "කියවීම" පරිපූර්ණ මිනිසකු නිර්මාණය කිරීමට ඉවහල් වන අතීතයේ සිට මේ දක්වාම සමාජය විසින් ඉහළින්ම පිළිගන්නා වූ කරුණකි. එනම්, මිනිස් ජීවිතය තුළ වැදගත් ස්ථානයක් කියවීමට හිමිවේ. කියවීම පුද්ගල දැනුම, ආකල්ප, හැකියාව, නිර්මාණශීලීත්වය, පෞරුෂ ගුණාංග, මානසික හැකියාවන් ආදී කොටගත් බොහෝ ගුණාංග වර්ධනයට දායක වනු ඇත (සුනිල්, අමරසිරි, ගුණසේකර සහ සුබසිංහ, 2016).

ඉගෙනුම් ක්‍රියාකාරකම් වර්ධනය සඳහා ද කියවීම අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් සඳහන් කළ හැකිය. ධාරණ ශක්තිය වර්ධනය කර ගනිමින් සිසුන්ගේ අධ්‍යාපන හැකියාව දියුණු කරගැනීමට කියවීම ප්‍රයෝජනවත් වේ. එය රටක අනාගතය තීරණය කරන ප්‍රධානතම සාධකය වන අධ්‍යාපනය සමග බැඳී පවතී (Kutay, 2014).

ශ්‍රී ලාංකීය පාසල් අධ්‍යාපනය තුළ සංකීර්ණ විෂය මාලාවක් සමඟ අධ්‍යාපන කටයුතුවල නිරත වීමට සිදුවීමත් සමඟ කියවීමට කාලය යොමු වීම බොහෝ විට අවම මට්ටමක පවතී. වර්තමාන විමර්ශනවලින් පැහැදිලි වන පරිදි විභාග මූලික අධ්‍යාපන ක්‍රමයක් මෙරට ක්‍රියාත්මක වීම තුළ සිසුන් කියවීමට යොදවන කාලය ඉතාම පහළ මට්ටමක පවතින අතර තාක්ෂණික දියුණුවද කියවීම පහළ වැටීමට හේතු වී ඇත. විශේෂයෙන්ම වර්තමාන උසස් පෙළ පාසල් දරුවන් කියවීමට දක්වන නැඹුරුතාව අධ්‍යයනයට ගනිමින් ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා එය බලපාන ආකාරය මෙහිදී විශ්ලේෂණයට ලක් කරනු ලබයි.

### *1.1 අධ්‍යයන අරමුණු*

උසස්පෙළ පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු හා බැඳුණු මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකාවේ උසස් පෙළ සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා වන බලපෑම අධ්‍යයනය කිරීම වන අතර උසස් පෙළ කලා, වාණිජ, විද්‍යා, තාක්ෂණවේදය වන කාණ්ඩවල සිසුන්ගේ අධ්‍යාපනය කෙරෙහි

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
kgmadara97@gmail.com

කියවීමේ පුරුදුවල බලපෑම අධ්‍යයනය කිරීම උප අරමුණ වේ.

**2. අධ්‍යයන ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික, ද්විතියික යන දත්ත දෙවර්ගයම භාවිතා කරන ලදී. මෙහිදී ප්‍රශ්නාවලි ක්‍රමය මගින් ප්‍රාථමික දත්ත ද අධ්‍යයනයට අදාළව දෙපාර්තමේන්තු වාර්තා, පූර්ව පර්යේෂණ ආදිය මගින් ද්විතියික දත්ත ද යොදා ගන්නා ලදී. ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය මගින් මැදිරිගිරිය කොට්ඨාසයට අයත් පාසල් 35න් උසස් පෙළ පහසුකම් සහිත පාසල් 7 මූලික කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එහි දී 2022 දත්තවලට අනුව සිසුන් 890ක් අතරින් 100ක නියැදියක් තෝරා ගන්නා ලදී. එසේම, දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, කයි වර්ග පරීක්ෂාව උපයෝගී කර ගන්නා ලදී.

**3. දත්ත විශ්ලේෂණය**

උසස් පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධන අතර සම්බන්ධතාව අධ්‍යයනය මෙන්ම කලා, වාණිජ, විද්‍යා, තාක්ෂණවේදය විෂය කාණ්ඩ හදාරන සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධන අතර සම්බන්ධතාව අධ්‍යයනයට ප්‍රධාන වශයෙන් කයිවර්ග පරීක්ෂාව භාවිතා කරමින් විශ්ලේෂණය සිදු කරන ලදී.

***3.1 උසස් පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධන අතර සම්බන්ධතාව***

කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධන අතර සම්බන්ධතාව කලා, වාණිජ, විද්‍යා, තාක්ෂණවේදය විෂයන් පදනම් කරගනිමින් සිදුකර ඇත.

වගු අංක 1: කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධන අතර සම්බන්ධතාව

| විචල්‍යය | කයි අගය | වෙසෙසි අගය |
|---|---|---|
| උසස් පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධන අතර සම්බන්ධතාව | 62.515 | 0.000 |
| කලා විෂය ධාරාව හදාරන සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධනය අතර සම්බන්ධතාවය | 10.074 | 0.018 |
| වාණිජ විෂය ධාරාව හදාරන සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධනය අතර සම්බන්ධතාවය | 14.166 | 0.003 |
| විද්‍යා විෂය ධාරාව හදාරන සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධනය අතර සම්බන්ධතාවය | 17.929 | 0.000 |
| තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධනය අතර සම්බන්ධතාවය | 12.959 | 0.005 |

*මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2022*

කයිවර්ග පරීක්ෂාවට අනුව, උසස් පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධන අතර සම්බන්ධතාවක් ($p = 0.000 < 0.05$) පවතින බව හඳුනාගත හැකිය. එසේම කලා විෂය ධාරාව හදාරන සිසුන් ($p = 0.018 < 0.05$), වාණිජ විෂය ධාරාව හදාරන සිසුන් ($p = 0.003 < 0.05$), විද්‍යා විෂය ධාරාව හදාරන සිසුන් ($p = 0.000 < 0.05$) සහ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන සිසුන් ($p = 0.005 < 0.05$)ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධනය අතර ද සම්බන්ධතාවක් පවතින බව හඳුනාගත හැකිය.

## 4. නිගමන

සමස්තයක් ලෙස ගත් විට පැහැදිලි වන්නේ උසස් පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදු හා අධ්‍යයන කාර්ය සාධනය අතර සම්බන්ධතාවක් පවතින බවයි. එනම් සිසුන් දෛනිකව කියවීමේ පුරුදු සඳහා ගත කරන කාලය අඩු වන විට අධ්‍යයන කාර්ය සාධනය පහළ මට්ටමක පවතියි. එසේම සිසුන් කියවීමේ පුරුදු වර්ධනය කරගැනීමට යොමු වුවද තවමත් එය සාමාන්‍ය මට්ටමක පැවතීම හේතුවෙන් අධ්‍යාපනයට යොමු වීමේ දුර්වලතාවක් පවතින බව නිගමනය කළ හැකිය. එසේම කලා, වාණිජ, විද්‍යා, තාක්ෂණවේදය යන විෂය කාණ්ඩවල අධ්‍යයන කාර්ය සාධනය ඉහළ නැංවීමට කියවීම මූලික අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

සිසුන් කියවීමේ පුරුදු සඳහා වැය කරන කාලය තවදුරටත් වර්ධනය කර ගැනීමෙන් ධනාත්මක වෙනස්වීම් ලබා ගැනීමට හේතුවන බව හඳුනාගත හැකිය. එමෙන්ම කියවීමේ පුරුදු වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර සිසුන් තුළ කියවීමේ ගුණාංග වර්ධනය කිරීම මගින්ද වඩාත් සාර්ථක අධ්‍යාපනයක් ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව උදාවන අතර ඒ තුළින් නිසි පරිදි කියවීමේ ගුණාංග වර්ධනය කරගනිමින් අධ්‍යයන කාර්ය සාධනය සඳහා යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


Child Activity Survey. (2020). Department of Census and Statistics, Colombo.

Kutay, V. (2014). *A Survey of the reading habits of turkish high school students and an examination of the efforts to eccourage them to read.* University of Loughborough, Center Information Management School of Business and Economics.

Sunil, W., Amarasiri, G. D., Gunasekara, A. S., & Subasinghe, K. (2016). Reading Habits and Obstacles faced by school Children in Northern and Eastern Provinces in Sri Lanka.

ලියනගේ. (2014). ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය.

කුලතුංග, (2016). උපාධි අපේක්ෂකයින්ගේ කියවීමේ පුරුදු හා පුස්තකාල භාවිතය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

ශ්‍රී ලංකාවේ වාර්ෂික පාසල් සංගණන වාර්තාව. (2020). අධ්‍යාපන අමාත්‍යංශය, බත්තරමුල්ල